8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# මෙතම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාමය සහ සෞඛ්‍ය ගැටලු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

අමරබන්දු පී.එන්., සේනානායක බී., දර්ශන ඒ.ටී., වලස්මුල්ලගේ ටී., මධුහංසි ජී.ජී.ඒ.*
සහ ප්‍රියදර්ශන, එස්.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ශ්‍රී ලංකාව
asankagenegama17@gmail.com

**සාරසංක්ෂේපය**

වර්තමානයේ ගෝලීය ව පවතින ප්‍රධාන ගැටලුවක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුද්ගලයන් තුළ ඇති වන ඇබ්බැහිකාරීත්වය හඳුනාගත හැකි ය. මුල්කාලීන ව, වැඩිවශයෙන් හෙරොයින් සහ ගංජා වැනි මත්ද්‍රව්‍ය පිළිබඳ ව අවධානය යොමු කරනු ලැබුව ද වර්තමානයේ කෘත්‍රිම ව නිපදවන මනෝවර්ධක ගණයේ ඖෂධ හා මෙතම්පිටමින් (අයිස්) කෙරෙහි පුද්ගලයින් යොමුවීමේ සැලකිය යුතු ප්‍රවණතාවක් පවතින බව නිල සංඛ්‍යාත්මක තොරතුරු මගින් තහවුරු වී ඇත. මේ අනුව, මෙතම්පිටමින් භාවිතයේ ප්‍රවණතාවයන් සහ භාවිත කරන පුද්ගලයින්ගේ මනෝ-සමාජ භාවයන් හා චර්යාත්මක වෙනස්කම්, මෙතම්පිටමින් භාවිතයෙන් ඔවුන් වෙත එල්ල වී ඇති සෞඛ්‍යමය බලපෑම් කෙබඳු ද යනාදිය පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මෙතම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ පැතිකඩ, භාවිත රටාවන්, භාවිතය හා සම්බන්ධ සුවිශේෂි චර්යාවන් සහ භාවිතයෙන් සිදු වන සෞඛ්‍ය බලපෑම කවරේ ද? යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව විය. අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අනුව ඉහළ ව්‍යාප්තියක් සහිත කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන් ඇතුළු ව අනෙකුත් දිස්ත්‍රික්කයන් ද අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස සලකන ලදි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කළ අතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සැඟවුණු කණ්ඩායම් වන බැවින් හිමබෝල නියැදිම් ක්‍රමය අනුව මෙතම්පිටමින් භාවිත කළ පුද්ගලයින් 50 දෙනෙකු අධ්‍යයනයේ නියැදිය ලෙස යොදාගන්නා ලදි. එසේ ම, දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සහ නිරීක්ෂණය භාවිත කර ඇත. අධ්‍යයනයේ සොයාගැනීම් අනුව, නියැදියට අයත් මෙතම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගෙන් බහුතරය එනම් 72% (36) චයිනීස් ක්‍රමය (බල්බ කොටසක් තුළ මෙතම්පිටමින් දමා රත්කර) ආඝ්‍රාණය කර අයිස් භාවිත කර ඇත. එසේ ම, මෙතම්පිටමයින් භාවිත කරන පුද්ගලයින් තුළ ඇති වන කෙටිකාලීන චර්යාත්මක වෙනස්කම් ලෙස, නින්ද නො යාම (72%), දැඩි ආහාර අරුචිය (36%), දත්මිටි කෑම, දත් එකමත එක තද වීම (26%) හා කායික වශයෙන්, ඉහළ උෂ්ණත්වයන් හට ගැනිම (08%) යනාදිය හඳුනාගත හැකි ය. එසේ ම, දිගුකාලීන ව ඇති වන ප්‍රධාන වෙනස්කම් ලෙස, කායික ව ඇඟ කෙට්ටු වීමේ ස්වභාවය හා දුර්වල වීම (32%), මනෝවිද්‍යාත්මක වශයෙන් සිදු වන වෙනස්කම් ලෙස, මානසික විකෘතිතාවයන් සමඟ ප්‍රචණ්ඩකාරී ස්වභාවය හෙවත් 'මෙත් සයිකෝසිස්' රෝග තත්ත්වය ඇති වීම (10%), භ්‍රාන්තිකාරක තත්ත්වයන් ඇති වීම (4%) හඳුනාගත හැකි ය. තව ද, අධ්‍යයනයට භාජනය කළ මෙතම්පිටමින් භාවිත කළ 64% (32) දෙනෙක් මෙතම්පිටමින් සම්බන්ධ ඉහළ ඇබ්බැහිකාරිත්වයක් පෙන්නුම් කරයි. මේ අනුව, මෙතම්පිටමින් භාවිතය කායික හා මානසික ව පුද්ගලයා කෙරෙහි ඉතාමත් ඉහළ බලපෑමක් සිදු කරන බව නිගමනය කළ හැකි ය. එසේ ම, අයිස් මගින් පුද්ගලයාට හා සමාජයට වන බලපෑම ඉතාමත් අහිතකර බවත් එය ප්‍රතිකාර ක්‍රියාවලියකින් සියයට සියයක් යථා තත්ත්වයකට ගෙන ඒමට නො හැකි බවත් අධ්‍යයනය මගින් අනාවරණය විය. මේ අනුව, මෙතම්පිටමින් ඇතුළු මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය සඳහා කඩිනම් වැඩසටහන් දියත් කිරීම හා මෙතම්පිටමින් සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් සඳහා විශේෂ ප්‍රතිකාර ක්‍රියාවලියක් ආරම්භ කිරීම, ව්‍යාප්තිය හා එහි හානිය අවම කිරීමට ප්‍රජා මූලික උපදේශන වැඩසටහන් සිදු කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** *මෙතම්පිටමින්, ඇබ්බැහිකාරීත්වය, මෙත් සයිකෝසියාව, මත්ද්‍රව්‍ය, සෞඛ්‍ය*